සිෆ්ලෝන් ඖෂධ සමාගම
SIFLON DRUGS

සමාගම් විස්තරය

පෞද්ගලික අයිතියක් ඇති සමාගමක් වන සිෆලොන් ඩ්‍රග්ස් වාර්ෂිකව දළ වශයෙන් ටොන් 37 ක සත්ත්ව බෙහෙත් නිෂ්පාදනය කරයි. එසේ වුවත් සමාගමේ නිෂ්පාදන ධාරිතාව වසරකට ටොන් 72 කි. ඉන්දියාවේ ආන්ද්‍රා ප්‍රදේශ් ප්‍රාන්තයේ අනන්තපූර් දිස්ත්‍රික්කයේ පිහිටා ඇති මෙම කර්මාන්තශාලාව කුඩා ප්‍රමාණයේ එකකි. මෙම කර්මාන්තය 1999 යේදී පිහිටුවනු ලැබූ අතර සේවකයන් 40 කින් සමන්විතය. කෙසේ වුවත් සේවකයන්ගෙන් 50% ක් පමණ කොන්ත්‍රාත් පදනම යටතේ සේවය කරයි. මෙම සමාගම දෛනිකව (පැය 24) සේවා මුර 3 ක් යටතේ වර්ෂයකට දින 330 ක් ක්‍රියාත්මක වේ. මෙම නිෂ්පාදනාගාරයට ඔක්ෂික්ලෝසනයිට් (Oxyclozanide), රෆොක්සනයිඩ් (rafoxanide), ක්ලෝසන්ටෙල් (Closantel), ක්ලොසන්ටෙල් සෝඩියම් (closantel sodium), නික්ලෝසනයිඩ් (niclosamide) ආදි වශයෙන් වර්ග 4-5 ප්‍රමාණයක් සත්ත්ව බෙහෙත් නිපදවීමේ හැකියාව ඇත. මෙම කර්මාන්තය තවදුරටත් ව්‍යාප්ත කිරීමේ අදහසින් සිටින අතර වර්ෂයකට ටොන් 120 දක්වා ධාරිතාවය වැඩි කිරීමේ දළ සැකසුම් සමාගම සතුව ඇත. නිෂ්පාදනය කරන බෙහෙත් අතුරින් 80% ක් විතර අපනයනය කරයි. පසු ගිය වර්ෂ 3, 4 ඇතුලත බලශක්තීන් සඳහා වු වියදම වැඩි වී ඇති බැවින් සම්පූර්ණ නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා වැය වන මුදලින් බල ශක්ති සඳහා වැයවන ප්‍රතිශතය සීඝ්‍ර ලෙස ඉහල යමින් පවතී. නිෂ්පාදන ධාරිතාවය වැඩි කිරීමට අදහස් කරන බැවින් බලශක්ති කාර්යක්ෂමතාවය පිළිබඳ අධ්‍යනය කිරීමට අභ්‍යන්තරයෙන්ම කණ්ඩායමක් පත් කිරීමට සමාගමට අවශ්‍ය වී ඇත. GERIAP ව්‍යාපෘතිය සමග සම්බන්ධවීමේ ප්‍රධාන අරමුණු වලින් එකක් වන්නේ ඉහත කී බලශක්ති කාර්යක්ෂමතාවය පිළිබඳ කලයුතු අධ්‍යනයයි.

ක්‍රියාවලිය පිළිබඳ විස්තර

සිෆ්ලෝන් ඩ්‍රග්ස් නිෂ්පාදනය කරන ප්‍රධානම බෙහෙත් ද්‍රව්‍ය වන්නේ ඔක්ෂික්ලෝසනයිට් (Oxyclozanide) වන අතර මේ සඳහා සුදු යකඩ සහ වීදුරු මගින් ආවරණය කරන ලද රසායනික ක්‍රියාකාරක ස්පටික කරණ කේන්ද්‍රාපසාරී වෙන් කරන තැටි වියළන සහ කුඩු බවට පත් කරන උපකරණ පාවිච්චි කරනු ලැබේ. මෙම නිෂ්පාදන ක්‍රියාවලියේ එක් එක් අවස්ථා පහත දක්වා ඇත.

(1) නයිට්‍රේෂන් - අමුද්‍රව්‍ය සහ නයිට්‍රික් අම්ල, සුදු යකඩ ක්‍රියාකාරක තුලදී රසායනික ප්‍රතික්‍රියාවන්ට භාජනය කරයි. මෙම ප්‍රතික්‍රියාවේදී තාපය පිටවෙන බැවින් ක්‍රියාකාරකය සිසිල් කිරීම සඳහා ක්‍රියාකාරකයේ පිටත පෘෂ්ඨය හරහා සිසිල් ජල ධාරාවක් ගලායාමට සලස්වනු ලැබේ.

(2) රිඩක්ෂන් (අඩු කිරීම) - ඉහත සඳහන් රසායනික ප්‍රතික්‍රියාවෙන් ලැබු ප්‍රතිඵලය වන නයිට්‍රේට රසායනිකය වෙනත් සුදු යකඩ ක්‍රියාකාරකයකට යොමු කරනු ලැබේ. මෙම ක්‍රියාකාරකය තුලදී ඩයිසල්ෆයිඩ් (Di-sulfied) රසායනිකය සමග ප්‍රතික්‍රියාවට බඳුන් වේ. (ඩයිසල්ෆයිඩ් කරනු ලබන්නේ මෘදු යකඩ ක්‍රියාකාරකයක් තුලය).

(3) කන්ඩන්සේෂන් (ඝනීභවනය) - ඉහත ක්‍රියාවලියෙන් ලැබුණු මිශ්‍රණය වීදුරු මගින් ඇතුලත ආවරණය කරන ලද රියැක්ටරයක් වෙත යොමු කරයි. එහිදී ක්ලෝරයිඩ් අම්ලය සමග ප්‍රතික්‍රියාවට බඳුන් වී දළ ඔක්ෂි (OXY) සංයෝගය

(4) කේන්ද්‍ර අපසරණය: දළ ඔක්ෂි (OXY) අර්ධ ඝණ තත්වයේ පවතින අතර කේන්ද්‍ර අපසරණ උපකරණය තුළදී එහි ඇති ජලය ඉවත් කිරීමෙන් වඩා වියලි තත්වයට පත් කරනු ලබයි.

(5) වියලනය සහ කුඩු බවට පත් කිරීම - ඉහත කී සංයෝග තැටි වියලන යන්ත්‍ර තුළදී වියලා ඇසීරීමට පෙර කුඩු බවට පත් කර ගනු ලැබේ.

ක්‍රමවේදයේ යෙදවීම

සමාගමේ ශක්ති කාර්යක්‍ෂමතාවය දියුණු කිරීමේ ක්‍රමවේදය පිළිබඳ වු කෙටුම්පත නිෂ්පාදනාගාරය තුල බලශක්තිය අමුද්‍රව්‍ය පිරිමැස්ම, නාස්තිය අඩු කිරීම ආදි වශයෙන් වු කටයුතු අදුනා ගැනීමක් ක්‍රියාවට නැගීම පිළිබඳව ඇගයීමකට ලක් කිරීමටත් මූලික පදනම වශයෙන් භාවිතා කරන ලදී. මෙහිදී ලැබූ ආකර්ෂණීය අත්දැකීම් සමහරක් නම්

✷ **කර්තව්‍ය 1 b - කණ්ඩායමක් පිහිටුවා එය පිළිබඳ කාර්යය මණ්ඩලය දැනුවත් කිරීම**
පූර්ණකාලින සේවකයන් 20 ක් ගෙන් සමන්විත කුඩා / මධ්‍යම ප්‍රමාණයේ සමාගමක් වන මෙහි විධිමත් බලශක්ති කළමනාකරණ පද්ධතියක් හෝ ක්‍රියා පටිපාටියක් නොමැති අතර සියලු තිරණ ගනු ලබන්නේ කළමනාකරණය කොටස්කරු විසිනි. ප්‍රමාණාත්මක වශයෙන් මෙම සමාගම ඉතා කුඩා බැවින් කණ්ඩායමක් සකස් වී ඇත්තේ සමාජිකයන් 3 දෙනෙකුගෙන් පමණි. කළමනාකාර කොටස්කරු, නිෂ්පාදන කළමනාකරු සහ නිෂ්පාදන නිළධාරී යන අය ගෙනි. වැඩහල නියෝජනය කිරීම සඳහා නිළ වශයෙන් සේවක නියෝජිතයෙකු කණ්ඩායමට ඇතුලත් වී නැති නමුත් බලශක්ති පාවිච්චිය පිළිබඳ තක්සේරු කිරීම, නව ක්‍රියා මාර්ග වල ප්‍රගතිය පිළිබඳ තොරතුරු ලබා ගැනීමේ ප්‍රධාන ප්‍රභවය වැඩහලයි.

උගත් දේ : බලශක්ති අධ්‍යයනය සඳහා පිහිටුවන ලද කමිටුව කුමණ ආකාරයක සමාජිකයන්ගෙන් සමන්විත වුවද ඵලදායි බලශක්ති තක්සේරුවක් සඳහා වැඩ පලෙහි සේවකයන්ගෙන් ලබා ගන්නා තොරතුරු ඉතා වැදලත්වේ.

✷ **කර්තව්‍ය 2 d – මූලික මට්ටමක් තහවුරු කර ගැනීම සඳහා යෙදවුම්, නිමැවුම්, වියදම් සංඛ්‍යාත්මකව ගණනය කිරීම**

යන්ත්‍රාගාරයේ භාවිතා වන විවිධාකාරවු යන්ත්‍ර සූත්‍ර පිළිබඳ බොහෝ දත්තයන් සාමාන්‍යයෙන් සමාගම සතුව නැත. මෙම යන්ත්‍රසූත්‍ර පිළිබඳව පරියන්ත දත්තයන් (මූලික දත්තයන්) ලබා ගැනීම සඳහා අවශ්‍ය වන වැදගත් වු සාධකයන් මැනීම සඳහා නිරීක්ෂණ උපකරණ භාවිතා කරනු ලැබේ. මෙම උපකරණ කර්තවය 5 යටතේ දක්වා ඇති තෝරා ගැනීම ක්‍රියාවට නැංවීමේදී ඇති වන ප්‍රතිපල නිරීක්ෂණය කර ගැනීම සඳහා යොදා ගන්නා ලදී.

උගත් දේ : ඉතා වැදගත් වු සාධක මැනීම සඳහා අධීක්ෂණ උපකරණ අවශය වන අතර විශේෂයෙන්ම යන්ත්‍රසූත්‍ර පිළිබඳ මූලික දත්තයන් නොමැති අවස්ථාවලදී මේ සඳහා සමාගම සතුව අධීක්ෂණ උපකරණ නොමැති අවස්ථාවලදී බාහිර පහසුකම් සලසන්නෙකුගේ සහය ලබා ගත හැක.

✷ **කර්තව්‍ය 3 b – ක්‍රියාවට නැංවිය හැකි විකල්ප හඳුනා ගැනීම**
බලශක්ති තක්සේරුවක් කිරීමේ කර්තව්‍යයේදී එකතු කර ගත් අධීක්ෂණ දත්තයන් සහ තත්ව පරීක්ෂණය පදනම් කොට ක්‍රියාවට නැගිය හැකි විකල්ප හඳුනා ගෙන දීර්ඝ වගුවක් පිළියෙල කිරීම බුද්ධි කළම්බන (Brain Storm) සැසියකදි සමාන්‍යයෙන් සිදු කෙරේ. මෙසේ පිළියෙල කර ගත් වගු අතුරින් කුමන විකල්පය තාක්‍ෂණිකව , ආර්ථිකව සහ පාරිසරිකව ක්‍රියාවට නැගිය හැකි දැයි සොයා බැලීම සඳහා පිරික්සීමකට ලක් කරනු ලැබේ. කෙසේ වුවද මෙම සමාගමෙහි ක්‍රියාවට නැගිය හැකි විකල්ප ප්‍රත්‍යක්ෂ බැවින් බුද්ධි කලම්බන සැසියක් නොපවත්වන ලදී. මෙම ප්‍රත්‍යක්ෂ වු විකල්ප අතුරින් එකක් වුයේ දැව දහනයෙන් ක්‍රියාත්මක වන නව බොයිලේරුව වඩාත් කාර්‍යක්‍ෂම වු ඛනිජ තෙල් දහනයෙන් ක්‍රියාත්මක වන නව බොයිලේරුවක් මගින් ආදේශ කිරීමයි. අකාර්‍යක්‍ෂම දැව දහන බොයිලේරුව ශක්තිය අපතේ යෑම සඳහා වන මූලික සාධකය ලෙස තක්සේරු කිරීමේදී හඳුනා ගන්නා ලදී. එම නිසා ඛනිජ තෙල් දහනයෙන් ක්‍රියාත්මක වන බොයිලේරුවක් ආදේශ කිරීමෙන් අදුනා ගන්නා ලද බලශක්ති අපතේ යාම් රාශියක් නවතාලිය හැක.

උගත් දේ : සැබෑ අවස්ථාවක ගැලපෙන පරිදි විකල්ප හඳුනා ගැනීමේ ක්‍රියාවලිය සකස් කිරීම වැදගත් වනු ඇත. ෙ විකල්පය ඉතා පැහැදිලි ප්‍රත්‍යක්‍ෂ එකක් වන අවස්ථාවකදී බුද්ධි කලම්බන ක්‍රියාවලිය අවශ්‍යය නොවනු ඇත.

✷ 6 වන පාදය - නිරන්තර වැඩි දියුණු කිරීම්

බලශක්ති කාර්යක්‍ෂමතාවය පිළිබඳ අධ්‍යනයකින් පසු කාර්යක්‍ෂමතාවය වැඩි දියුණු කිරීමේ මාර්ග ක්‍රියාවට නැංවීමෙන් ලබාගත හැකි ප්‍රතිලාභ ප්‍රමාණය සමාගම විසින් වටහා ගන්නා ලදී. පහත සඳහන් අදියරයන් ගෙන් සමන්විත වූ ක්‍රමවේදයක් ක්‍රියාවට නැංවීම සඳහා සමාගම සැලසුම් කරයි.

- බලශක්තිය නිසි ලෙස ක්‍රියාවට නැංවීමේ උපාය මාර්ගයන් සමාගම ව්‍යාප්ත කිරීමේ ව්‍යාපෘති තුලට අන්තර්ගත කිරීම සහ කර්මාන්තශාලාව ව්‍යාප්ත කිරීමෙන් පසු නව අධ්‍යනයක් කිරීම.
- අස්වැන්න වැඩි කිරීම සඳහා රසායනික ක්‍රියාවලිය උපරිම ඵලදායී තත්වයක් ලැබෙන පරිදි සකස් කිරීම සඳහා ක්‍රියා කිරීම.
- වාෂ්ප සහ විදුලි අවශයතාවයන් සඳහා ඒකාබද්ධ උත්පාදන පද්ධතියක් ක්‍රියාවට නැංවීමේ හැකියාව සොයා බැලීම

උගත් දේ : නිරන්තරයෙන් සිදු කරන බලශක්ති කාර්යක්‍ෂමතාවය පිළිබඳ ක්‍රමවේදයක් සමාගම තුල ස්ථාපිත කිරීම සඳහා සාර්ථක ලෙස ක්‍රියාවට නැගුණු බලශක්ති අධ්‍යයනය පුරෝගාමී පියවරක් වේ.

විකල්ප

කණ්ඩායම විසින් කරන ලද අධ්‍යනයෙන් පසු බලශක්ති කාර්යක්‍ෂමතාවය වැඩි දියුණු කිරීම සහ රසායනික ක්‍රියාවලිය වැඩි දියුණු කිරීමේ (CP/EE) විකල්ප 20 ක් හඳුනා ගන්නා ලදී. සමාගම ව්‍යාප්ත කිරීමේ දැඩි ඕනෑකමකින් පසුවන බැවින් විකල්ප 4 ක් ශත්‍යතා විශ්ලේෂණයකට භාජනය කරන ලදී. එම විකල්ප සහ ඒවායේ ප්‍රමුඛතා ලක්‍ෂණ පහත සඳහන් වගුවේ සාරාංශ ගත කොට ඇත.

✷ අවධානය යොමු කල යුතු ප්‍රදේශ : සම්පූර්ණ නිෂ්පාදනය සලකා බැලූ විට බලශක්තිය සඳහා වැයවීමේ ප්‍රතිශතය අධික බැවින් බල ශක්ති කාර්යක්‍ෂමතාවය වැඩි දියුණු කිරීම සඳහා පියවර ගැනීම. ඝණීකරණය / සිසිලන ස්ථම්භකයේ හැකියාව, රසායනික ද්‍රව්‍යයන් නැවත උපයෝගි කර ගැනීම.

✷ හඳුනා ගන්නා ලද විකල්ප 2 ක් ක්‍රියාවට නංවන ලදී. මේ සඳහා ඇමරිකානු ඩොලර් 5814 ක් ආයෝජනයක් අවශ්‍යය වූ අතර වාර්ෂිකව ලැබෙන ඉතිරිය ඇ.ඩො. 6,140 ක් පමණ වේ. එම නිසා ප්‍රතිලාභ කාලය මාස 12 කට වඩා අඩුය.

✷ සම්පත් ඉතිරිය සලකා බැලූ විට මෙම යෝජනා ක්‍රියාවට නැංවීමෙන් වාර්ෂිකව දර ටොන් 150 ක් පමණ ඉතිරිවන අතර ඇසිටොන් ලීටර් 300 ක් පමණ නැවත ලබා ගැනීමට හැකිවේ. ඇසිටොන් ද්‍රාවනයක් වශයෙන් පාවිච්චි කරන අතර එය කාබන්ඩයොක්සයිඩ් සමඟ සසඳා බලන කල එමෙන් 23 න් ගුණයක් හරිතාගාර උණුසුම් කිරීමේ හැකියාවක් ඇති ද්‍රාවනයකි.

✷ ඉතිරි විකල්ප **2** ක ක්‍රියාත්මක කල යුතු අතර සමාගම ව්‍යාප්ත කිරීමත් සමඟ ඒවා ක්‍රියාත්මක කිරීමට සමාගම බැඳී සිටියි. මේ සඳහා ආයෝජනය ඇ.ඩො. 9,300 ක් වන බවට ගණන් බලා ඇති අතර එමගින් වාර්ෂිකව දළ වශයෙන් ඇ.ඩො. 2,800 ක ඉතිරියක් ලැබේ. ප්‍රතිලාභ ලැබෙන කාලය අවුරුදු 3-5 අතර වේ.

✷ ක්‍රියාවට නංවන ලද යෝජනාවල ප්‍රතිපලයක් වශයෙන් මෙම ව්‍යාපෘතිය ආරම්භයත් අවසානයත් අතර කාල සීමාවේදී මෙම නිෂ්පාදනාගාරය තුලින් හරිතාගාර වායුව මුදාහැරීමේ ප්‍රමාණය වර්ෂයකට ටොන් 200 කින් අඩු කර ගත හැකි විය. මෙම පාදක වර්ෂය වූ 2002 - 03 හිදී සමාගම විසින් මුදා හරින ලද හරිතාගාර වායු ප්‍රමාණයන් දළ වශයෙන් 29% ක ප්‍රතිශතයක් වේ. වගුව 2 න් නිෂ්පාදන ඒකකයක් සඳහා හරිතාගාර වායුවේ අඩුවීම පෙන්නුම් කරයි.

හරිතාගාර වායුව මුදා හැරීමේ ප්‍රමාණය ගණනය කිරීම සඳහා UNEP ආයතනය මගින් නිෂ්පාදනය කරන ලද හරිතාගාර වායු ඝනකයක් භාවිතා කරන ලදී.

වගුව 1 : විකල්ප හඳුනා ගැනීම්/ සමාගම විසින් ක්‍රියාවට නැංවීම

අවධානය යොමු කල යුතු ප්‍රදේශ / විකල්ප	රසායනික ක්‍රියාවලිය තාක්‍ෂණික ක්‍රම	මූල්‍ය ශක්‍යතාව	පාරිසරික ප්‍රතිලාභ	වෙනත් කරුණු
බොයිලේරු: දර දහනයෙන් ක්‍රියාත්මක වන බොයිලේරු වෙනුවට වඩා කාර්යක්‍ෂම වන ගල් අඟුරු හෝ බනිජ තෙල් දහනයෙන් ක්‍රියා කරන බොයිලේරු යොදා ගැනීම	නව තාක්‍ෂණික උපකරණ	ආයෝජනය = ඇමරිකානු ඩොලර් 9,302 වාර්ෂික ඉතුරුම් = ඇමරිකානු ඩොලර් 2,791 ප්‍රතිලාභ ලැබෙන කාලය = + 3 අවුරුදු	හරිතාගාර වායු ඉතුරුම් අවුරුද්දකට ටොන් 195 බලශක්ති ඉතුරුම් = 150 දර ටොන් / අවුරුද්දකට සේවකයන්ට දුම් හා දූවිලි වලින් තොර පරිසරක්	මෙම තෝරා ගැනීම දැනට ක්‍රියාවට නගා නොමැත.
කන්ඩෙන්සර(ඝණිකරණය) වාෂ්ප නල පරිවාරණය කිරීමත් ඝණිකරණය කරන ලද වාෂ්ප ලබා ගැනීමේ ටැංකියක් සහ ඝණිකරණයට භාජනය වන වාෂ්ප ටැංකියට එකතු කරන පද්ධතියක් සෑදීම මගින් වාෂ්ප බෙදා හැරීමේ පද්ධතිය වැඩි දියුණු කිරීම.	නිසියාකාරයෙන් පවත්වා ගැනීම එම ස්ථානයේදීම නැවත පාවිච්චිය සඳහා එක්රැස් කිරීම සහ නැවත පාවිච්චි කිරීම.	ආයෝජනය = ඇමරිකානු ඩොලර් **2,326** වාර්ෂික ඉතුරුම් = ඇ.ඩො. 2,791 ප්‍රතිලාභ ලැබෙන කාලය = මාස 11	හරිතාගාර වායු ඉතුරුම් අවුරුද්දකට ටොන් 195 බලශක්ති ඉතුරුම් = 150 දර ටොන් / අවුරුද්දකට ජල ඉතුරුම් ලීටර් -210	මෙම තෝරා ගැනීම ක්‍රියාවට නැංවූ අතර CP-EE කණ්ඩායම තාප පරිවාරක යොදා ඇති තැන් නිරීක්‍ෂණය සඳහා පුහුණු කරන ලදී.
ද්‍රාවක නැවත පාවිච්චි කිරීම: අතිරේක සිසිලන ස්ථම්භයක් ඉදිකිරීම මගින් පාවිච්චි කරන ලද ද්‍රාවක නැවත පාවිච්චිය සඳහා ප්‍රයෝජනයට ගැනීමේ ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම.	නව තාක්‍ෂණික උපකරණ	ආයෝජනය = ඇ.ඩො. 3,488 වාර්ෂික ඉතුරුම් = ඇ.ඩො. 3,349 ප්‍රතිලාභ ලැබෙන කාලය = මාස 13	පරිසරයට ද්‍රාවක පිටවීම අඩු කිරීම සහ යහපත් පරිසරයක් ඇති කිරීම. ද්‍රාවක නැවත ලබා ගැනීම ලීටර 300	තෝරා ගැනීම් ක්‍රියාවට නැංවෙන අතර ප්‍රයෝජනයට ගත් ද්‍රාවක නැවත ලබා ගැනීමේ ක්‍රියාවලිය පිළිබඳ පුහුණුව ලබා දීම.

CP-EE යෝජනා ක්‍රියාවට නැංවීමෙන් ඉහත සඳහන් වගුවේ දක්වා ඇති ප්‍රත්‍යක්‍ෂ ප්‍රතිලාභ වලට අමතරව පැහැදිලිව දැකිය නොහැකි බොයිලේරුවේ ජීව කාලය දික්වීම, නඩත්තු කටයුතු අඩුවීම, බොයිලේරුවට පාවිච්චියට ගන්නා වතුරේ තත්වය ඉහල බැවින් එම වතුර අස්කිරීමේ (Blow down) වාර ගණන අඩුවීම වැනි ප්‍රතිලාභද ලැබේ. පාවිච්චි කරන ලද ඇසිටොන් නැවත ලබා ගැනීමේ ක්‍රියාවලිය දියුණු කිරීම මගින් ද්‍රාවක වාෂ්ප නිසා ඇති විය හැකි වෘත්තීමය සෞඛ්‍ය අවදානම අඩු වේ.

වගුව 2 : CP-EE පෙර සහ පසුව අමුද්‍රව්‍ය සැසදීම සහ ප්‍රයෝජනයට ගැනීම

නිෂ්පාදන ටොන් එකකට	2002-03	2003-04	% වෙනස
ඩීසල්	1.75 KL	0.97KL	31%
රැහැන් විදුලිය	1564.3 kWhr	851.33 kWhr	45%
දැව	17.06T	12.4T	29%
ද්‍රාවක	23.70Lts.	4.86lts.	82%
නිෂ්පාදනය	21096 Kg.	41112 Kg.	
මුළු හරිතාගාර වායු	596 T	801 T	
නිෂ්පාදන ටොන් එකකට GHG	**28.25 T**	**19.48 T**	**29%**

වර්තමානයේ වගු අංක 2 ට අනුව මුළු හරිතාගාර වායු නිෂ්පාදනයේ වැඩි වීමක් සිදුව ඇත. අවධානය යොමු වු හරිතාගාර වායු නිෂ්පාදනයෙන් ටොන් 29 % ක ප්‍රමාණයක් අඩු වී ඇත. මෙය වැදගත් කරුණකි.

වැඩි විස්තර සඳහා

Mr. A. K. Asthana, Group Head Energy Management
Dr. P. K. Gupta, Director, NCPC-India
National Productivity Council,

5-6, Institutional Area, Lodi Road, New Delhi - 110003

Ph : 0091 – 11 – 24697446 , Fax : 0091 – 11 - 24698138
Em@il: ak.asthana@npcindia.org, ncpc@del2.vsnl.net.in

Disclaimer:

While reasonable efforts have been made to ensure that the contents of this publication are factually correct, UNEP does not accept responsibility for the accuracy or completeness of the contents, and shall not be liable for any loss or damage that may be occasioned directly or indirectly through the use of , or reliance on, the contents of this publication.